# <u>උපාධි ප්‍රදානෝත්සවය සඳහා ඔබ වෙත නිකුත් කරනු ලබන උපාධි ලෝගුව, හිස්වැස්ම සහ සාටකය භාවිත කිරීම සඳහා වන ආචාරධර්ම</u>

## <u>උපාධි ලෝගුව හා හිස්වැස්ම භාවිත කිරීම</u>

1. උපාධි ලෝගුව හා හිස්වැස්ම පැළඳිය යුත්තේ උපාධිලාභියා හෝ උපාධිධාරියා පමණක්ම වන අතර, උපාධි ප්‍රදානෝත්සවයේ උපාධිලාභීන්ගේ පෙරහැර පිටත්වීමට නියමිත අවස්ථාව වනවිට සෑම උපාධිලාභියෙකුම තම උපාධි ලෝගුව සහ හිස්වැස්ම පැළඳ සිටිය යුතුය.

2. උපාධි ලෝගුව හා හිස්වැස්ම නිවැරදිව පැළඳිය යුතු අතර, එහිදී හිස්වැස්මට සවිකර ඇති ටසලය (Tussle) වම්පසට සිටින සේ පැළඳිය යුතුය.

3. උපාධි ලෝගුව පැළඳීමේ දී,

   - කාන්තා උපාධිලාභීන් අනිවාර්යයෙන්ම අභිමත වර්ණයක සාරියකින් හෝ ඔසරියකින් පමණක් සැරසී සිටිය යුතුය.

   - පිරිමි උපාධිලාභීන් ජාතික ඇඳුමින් හෝ ටයි පටිය සහිත යුරෝපීය ඇඳුමින් සැරසී සිටිය යුතුය.

සැ.යු.- **<u>ඉහත සඳහන් ආකාරයේ ඇඳුමකින් සැරසී නොපැමිණෙන උපාධිලාභීන්ට උපාධි පෙරහැරේ ගමන් කිරීම සහ උපාධි ප්‍රදානෝත්සව අවස්ථාවේ වේදිකාවට ප්‍රවිශ්ඨ වීමට අවස්ථාව නොලැබෙනු ඇත.</u>**

4. උපාධි ලෝගුව, හිස්වැස්ම සහ සාටකය උපාධිය සංකේතවත් කිරීම සිදු කරන බැවින් එය ඉතා ගෞරවාන්විතව භාවිත කළ යුතුය.

5. උපාධි ලෝගුවට අගෞරව නොවන ලෙස සුදුසු පරිසරයක සහ සුදුසු ඉරියව්වක සිට ඡායාරූප ගැනීම සිදු කළ යුතුය.

6. **ඔබ වෙත නිකුත් කරනු ලබන උපාධි ලෝගුව හා හිස්වැස්ම අදාළ උපාධිලාභියා විසින් පමණක්ම පැළඳිය යුතු වන අතර**, අන්සතු කිරීම හා උපාධිධාරීන් නොවන (ඥාතීන්, හිතමිතුරන් සහ දරුවන් වැනි ) අයට පැළඳවීම නොකළ යුතුය.

*<u>සාටකය</u>*

➢ සාටකය පළඳවනු ලබන්නේ උපාධිය පිරිනැමුණු බව සංකේතවත් කිරීම සඳහා වන බැවින්, එය උපාධි ප්‍රදානෝත්සව අවස්ථාවේ <u>වේදිකාවට ප්‍රවිශ්ඨ වීමේදී පැළඳ සිටිය යුතුය.</u>